# 2025.06.13 දින පැවති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව
## වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව

**පැමිණීම**

1. ගරු සභාපති ටී.බී.ඩී ඇන්ටනී කුමාර් මයා
2. ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා
3. ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා
4. ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා
5. ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා
6. ගරු මන්ත්‍රී බී. ඇන්ටනී සුනිල් සාන්ත පෙරේරා මයා
7. ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා
8. ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ඩබ්.ෂවීන් ප්‍රනාන්දු මයා
9. ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය
10. ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය
11. ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා
12. ගරු මන්ත්‍රී කේ.ඩිලාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා
13. ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මයා
14. ගරු මන්ත්‍රී ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මයා
15. ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා
16. ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය
17. ගරු මන්ත්‍රී සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා
18. ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා
19. ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා
20. ගරු මන්ත්‍රී ආර්.එම්.අජිත් උදයසිරි රණතුංග මයා
21. ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මයා
22. ගරු මන්ත්‍රිනී එල්.ජයංගා රුවනාරි ප්‍රනාන්දු මිය
23. ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මිය
24. ගරු මන්ත්‍රී එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා
25. ගරු මන්ත්‍රී ජගත් කීර්ති කුමාර අබේරත්න මයා
26. ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මිය
27. ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා
28. ගරු මන්ත්‍රී කේ.අජිත් නිශාන්ත ප්‍රනාන්දු මයා
29. ගරු මන්ත්‍රී ඒ.ඒ.චොහාන් සංදීප් මයා
30. ගරු මන්ත්‍රී කේ.එල්.ඩී.ජී.සංජය අප්පුහාමි මයා
31. ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය
32. ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණී රෙක්ස් ප්‍රනාන්දු මයා
33. ගරු මන්ත්‍රී ඩබ්.දිනේෂ් සංජීව ප්‍රනාන්දු මයා
34. ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා
35. ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා
36. ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා
37. ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මයා
38. ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රීට් මිය

39. ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය
40. ගරු මන්ත්‍රිනී ආර්.පී.මෙලනි චතුරිකා රන්තිලක මිය
41. ගරු මන්ත්‍රි සුධීර ප්‍රදීප් රණසිංහ මයා
42. ගරු මන්ත්‍රි එස්.ඒ.දීපාල් මයා
43. ගරු මන්ත්‍රි එම්.පී.බ්‍රයන් පෙරේරා මයා
44. ගරු මන්ත්‍රි ඩබ්.විමලසිරි පෙරේරා මයා

මෙදින පෙ.ව 9.00ට විශේෂ මහ සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති ටී.බී.ඩී. ඇන්ටනී කුමාර් මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශිය සභා මහ සභා රැස්වීම් ශාලාවේදි ආරම්භ විය.

එදින ආගම සිහි කිරීමෙන් පසුව ගරු උප සභාපති තුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් විශේෂ මහ සභා රැස්වීම සඳහා ගරු සභාපති තුමා විසින් පිලිගන්නා ලදි.

එතුමා පවසා සිටියේ "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" යන තේමාව පෙරදැරි කරගෙන ජනතාවට යහපත් සේවයක් කිරීමට මෙම දේශපාලන ක්‍රියාදාමයෙහි යෙදෙන බවත් වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රි මණ්ඩලයේ 43 දෙනෙකුගේ කණ්ඩායමත් පරිපාලන නිලධාරියා වන ඩබ්.ඩී. ලූෂන් ලේකම් තුමා සහ 320 පමණ වන වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ කාර්ය මණ්ඩලයත් එකතු වී මෙතෙක් සිදු වී ඇති අඩුපාඩුකම් නිවැරදි කර ගනිමින් බල ප්‍රදේශයේ ජනතාව විසින් අංක එකට ඔසවා තබන සභාවක් බවට පත් කිරීමට සියලු දෙනාගේම සහයෝගය අපේක්ෂා කරන බවයි.

ඉන් පසු 2025.06.03 දින විශේෂ මහ සභාවේ න්‍යාය පත්‍රයට අනුව ගරු සභාපති තුමාගේ නිවේදන ප්‍රකාශයට පත් කරන ලදි.

1. 2026 වර්ෂය සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ අයවැය යෝජනා , ලබා දී ඇති ආකෘතිය අනුව සම්පූර්ණ කර ජූනි 30 ට ප්‍රථම ලබා දිය යුතුය.

2. සභාවේ කටයුතු වලට අදාල යෝජනා හැකි සෑම විටම අදාල කමිටු හරහා ඉදිරිපත් කරන ලෙස දන්වා සිටිමි.

3. මන්ත්‍රී නිල මුද්‍රාව/සාම විනිසුරු නිල මුද්‍රාව/මන්ත්‍රී හැදුනුම්පත සකස් කිරිම සඳහා ලබා දෙන ආකෘතියේ ඔබේ නම නිවැරදිව සිංහලෙන් සටහන් කර අත්සන ලබා දිය යුතුයි.

4. මන්ත්‍රී මණ්ඩලයේ තොරතුරු ඉදිරිපත් කිරිම සඳහා ලබා දී ඇති පත්‍රිකාව පුරවා පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් සමග කඩිනමින් මා වෙත ලබා දිය යුතුයි.

5. නිවාඩු ඉල්ලුම් පත්‍ර හා යෝජනා ඉල්ලුම් පත්‍ර මේ වන විට ඔබට ලබා දී ඇති නිසා එය අවශ්‍ය වූ විට නිසි පරිදි පුරවා භාර දීමට කටයුතු කරන්න.

6. වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ ගොඩනැගිලි සංවර්ධනය (ඉදි කිරීම් හා අලුත්වැඩියා) පිළිබඳ ප්‍රගතිය 2025 මැයි දක්වා වාර්ථාව අද දින ඔබ වෙත ලබා දී ඇත.

7. වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ 2025.05.31 දිනට මාර්ග සංවර්ධන ප්‍රගතිය අද දින ඔබ වෙත ලබා දී ඇත.

8. 2025 අප්‍රියෙල් දක්වා මාසික ආදායම් ප්‍රගතිය කාර්යාල මට්ටමින් ලබා දී ඇත.

9. 2025.04.30 දිනට වාර්ෂික හිඟ ආදායම් ප්‍රගතිය කාර්යාල මට්ටමින් ලබා දී ඇත.

10. 2025 අප්‍රියෙල් දක්වා ඒකාබද්ධ වැය සාරාංශය ඉදිරිපත් කර ඇත.

11. අද දින අදහස් ප්‍රකාශ කිරිම සදහා රැස්වීම් වාරය අවසානයේදි එක් පක්ෂයක් නියෝජනය කරමින් එක් මන්ත්‍රීවරයෙක්ට විනාඩි 5ක පමණ කාලයක් ලබා දෙනවා. එහිදි සභාවට අදාල කරුණු පමණක් කතා කිරීමට වල බලා ගන්න.

**යෝජනා අංක (i) a මුදල් හා ප්‍රත්පත්ති කාරක සභාව වෙත බලතල පැවරීම හා කාරක සභාව පත් කිරීම.**

මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව වෙත බලතල පැවරීම හා කාරක සභාවක් පත් කිරීමට අදාල පහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට ගරු සභාපති ටී.බී.ඩී ඇන්ටනී කුමාර් මයා, ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා, ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණී රෙක්ස් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා, ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා, ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා, ගරු මන්ත්‍රී ජගත් කීර්ති කුමාර අබේරත්න මයා, ගරු මන්ත්‍රී එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සංදීප් මයා, ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රිනි ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය, ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ආර්.ෂවීන් ප්‍රනාන්දු මයා හා බල ප්‍රදේශයේ පදිංචිකරුවන් ලෙස මනෝජ් හේට්ටිආරච්චි මයා, සුදත් චන්දන මයා සහ අනුර ජයසේකර මයා පත් කිරීමට හා පහත සඳහන් බලතල පැවරීමට සුදුසු බව යෝජනා කරන ලදි.

ඉන් අනතුරුව ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මයා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට පත් කර ඇති ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මිය වෙනුවට ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයාගේ නම යෙදිය යුතු බව යෝජනා කරන ලදි.

එම සංශෝධන වලට යටත්ව ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි. ඉන්පසු එම යොජනාව විවාදයකින් තොරව ඒකමතිකව සම්මත විය.

**මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව වෙත බලතල පැවරෙන බලතල**

1. ටෙන්ඩර් මණ්ඩල තීරණ සලකා බැලීම හා සභාවේ ගිවිසුම් සඳහා අනුමැතිය ලබා දිම.
2. මාසික ආදායම් වියදම් වාර්තා සලකා බැලීම, ගත යුතු ක්‍රියා මාර්ග තීරණය කිරීම හා සභාවේ කටයුතු වලට අදාල වියදම් සඳහා බලය ලබා දිම.
3. වරිපනම්, සියලුම බදු හා ගාස්තු නියම කිරීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

4. අය කර ගත නොහැකි ආදායම් කපා හැරීම පිළිබඳව අමාත්‍ය තුමාගේ අනුමැතිය සඳහා වන නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරිම.
5. ප්‍රාදේශිය සභාව තුල දේපළ බදු දීම, කුලියට දීම, බැහැර කිරීම හෝ වෙනත් ආකාරයක ගනුදෙනු පිළිබඳව ගත යුතු ක්‍රියාමාර්ග කවරේද යන්න නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
6. ප්‍රාදේශිය සභාවට දේපළ අත්පත් කර ගැනීම හා මිල දී ගැනීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
7. වාර්ෂික භාණ්ඩ හා තොග සමීක්ෂණ කාර්ය සිදු කිරීම පිළිබඳ ප්‍රගතිය මැන බැලීම සහ එහි දී අනුගමනය කළ යුතු ක්‍රමවේද පිළිබඳ ව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
8. ප්‍රාග්ධන භාණ්ඩ හෝ තොග ඌණතා පිළිබඳ විමර්ශනය කිරීම සහ ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
9. ප්‍රාග්ධන භාණ්ඩවලට හෝ තොග භාණ්ඩ වලට සිදු වන හානි හෝ පාඩු පිළිබඳව විමර්ශනය කිරීම සහ ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
10. ප්‍රාදේශිය සභාව සතු වත්කම් වල නාස්තිය හා දූෂණය අවම කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
11. ප්‍රාදේශිය සභාවට බලය ලැබී ඇති කාර්ය හෝ කර්තව්‍යය ක්‍රියාවට නැංවීමේදී සිදු විය හැකි වියදම් අවම කිරීමට අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
12. ප්‍රාදේශිය සභාවේ සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම සහ කෙටුම්පත් සංයුක්ත සැලැස්ම පිළිබඳ ව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
13. ප්‍රාදේශිය සභාවට අදාළ නීති කෘත්‍ය පිළිබඳව ගනු ලැබිය යුතු ක්‍රියාමාර්ග කවරේද යන්න පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
14. කාර්ය මණ්ඩලයේ සුභ සාධනය සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග සභාව වෙත වාර්තා කිරීම.
15. පරිපූරක ඇස්තමේන්තු හා වැය ශීර්ෂ හුවමාරු සඳහා නිර්දේශ ලබා දීම.
16. සභාවේ ආදායම් මාර්ග සංවර්ධනය සඳහා වන නිර්දේශ සභාව වෙත ඉදිරිපත් කිරීම හා සභාවේ වියදම් පාලනය සඳහා වන නිර්දේශ සභාව වෙත වාර්තා කිරීම, සභාවේ මූල්‍ය තත්වය මාසිකව විමර්ශනය කිරීම.
17. වාර්ෂික අයවැය යෝජනා පිළිබඳ නිර්දේශ සභාව වෙත ඉදිරිපත් කිරීම.
18. සභාවේ කාර්ය ස්ථාන වල හා කාර්ය මණ්ඩලය පිළිබඳ සොයා බැලීම සහ එම කටයුතු විධිමත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් හා උපකරණ සැපයීම.
19. සභාවට අවශ්‍ය කාර්ය මණ්ඩලය හඳුනා ගැනීම, අළුතින් ඇති කල යුතු තනතුරු අනුමත කර ගැනීමට අදාල නිර්දේශ සභාව වෙත ඉදිරිපත් කිරීම.
20. පැවරී ඇති බලතල වලට අදාලව ඉදිරිපත් වන විමර්ශන වාර්තා, විගණන වාර්තා, ගිණුම්කාරක සභා වාර්තා සලකා බැලීම හා පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
21. පැවරී ඇති බලතල වලට අදාලව කාර්ය ස්ථාන පරීක්ෂා කිරීම, කාර්ය මණ්ඩලයේ කටයුතු පරික්ෂා කිරීම හා ඒ තුලින් හඳුනා ගන්නා ලද අඩුපාඩු නිවැරදි කිරීමට අදාල උපදෙස් ගරු සභාපතිතුමා වෙත හා සභාව වෙත ඉදිරිපත් කිරීම.
22. පැවරී ඇති කටයුතු වලට අදාල ව්‍යාපෘති වාර්තා හා ඇස්තමේන්තු අනුමත කිරීම.
23. පැවරී ඇති කටයුතු වලට අදාල වන වාර්ෂික අයවැය යෝජනා, ව්‍යාපෘති වාර්තා හා අයවැය ඇස්තමේන්තු ගරු සභාපති තුමා වෙත ඉදිරිපත් කිරීම.

24. පැවරී ඇති විෂයන්ට අදාල කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කරන අංශ ප්‍රධානීන් හා සේවක පිරිස් ඇගයීම හා දුර්වල අංශ ප්‍රධානීන් හා සේවක පිරිස් පිළිබඳව ගරු සභාපති තුමා වෙත වාර්තා කිරීම.
25. පැවරී ඇති විෂයන්ට අදාල මහජන සේවාවන්ට අදාල කටයුතු කාර්යක්ෂමව කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගරු සභාපතිතුමා වෙත ඉදිරිපත් කිරීම.
26. පැවරී ඇති විෂයන්ට අදාල අණ පණත්, අතුරු ව්‍යවස්ථා හා ප්‍රතිපත්ති, පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ ක්‍රියාවට නැංවීම සහ ඒවායේ සංශෝධනය විය යුතු කරුණු ඇත්නම් සභාව වෙත වාර්තා කිරීම.
27. බල ප්‍රදේශයේ පෞද්ගලික අංශයේ දායකත්වය සහිතව ක්‍රියාත්මත කල හැකි වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනා ගැනීම හා ඒ පිළිබඳ නිර්දේශ සභාව වෙත ඉදිරිපත් කිරීම.
28. විෂයන්ට අදාල දේශිය / විදේශිය දැනුම හා පුහුණු කමිටු සාමාජිකයින් වෙත හා කාර්යමණ්ඩලය වෙත ලබා දීම.
29. සභාවේ කටයුතු විධිමත් කිරීම සඳහා අවශ්‍ය නව අතුරු ව්‍යවස්ථා හා ප්‍රතිපත්ති සකස් කර සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.
30. පැවරී ඇති කටයුතු වල ප්‍රගතිය කාර්තු වශයෙන් හා වාර්ෂිකව සකස් කර මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රදර්ශනය කිරීම.
31. කමිටුවලට පැවරෙන බලතල වලට අදාල කටයුතු වල ප්‍රගතිය මාසිකව සමාලෝචනය කිරිම හා කමිටු වාර්තාව ඊලග මහ සභා රැස්වීමට ඉදිරිපත් කිරීම.

**යෝජනා අංක (i) b කාර්මික සේවා කාරක සභාව වෙත අදාල බලතල පැවරීම හා කාරක සභාව පත් කිරීම.**

කාර්මික සේවා කාරක සභාව වෙත බලතල පැවරීම හා කාරක සභාවක් පත් කිරීමට අදාල පහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

කාර්මික සේවා කාරක සභාවට ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා, ගරු සභාපති ටී.බී.ඩී ඇන්ටනී කුමාර් මයා, ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණී රෙක්ස් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී කේ.අජිත් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ආර්.එම්.අජිත් උදයසිරි රණතුංග මයා, ගරු මන්ත්‍රී ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මයා, ගරු මන්ත්‍රී එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මයා, ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී බී. ඇන්ටනී සුනිල් සාන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රිනි ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය, ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා, ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා, ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා හා බල ප්‍රදේශයේ පදිංචිකරුවන් ලෙස දීප්ත පතිරත්න මයා, ෂර්ලි පෙරේරා මයා සහ ලොඩ්වික් නිහාල් මයා පත් කිරීමට හා පහත සඳහන් බලතල පැවරීමට සුදුසු බව යෝජනා කරන ලදි.

ඉන් අනතුරුව ගරු මන්ත්‍රී ඩී. මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා කමිටුව සභාපති ලෙසත් ගරු සභාපති ටී.බී.ඩී ඇන්ටනී කුමාර් මයා කමිටු සාමාජිකයකු ලෙසත් සංශෝධනය විය යුතු බව යෝජනා කරන ලදි.

එම සංශෝධන වලට යටත්ව ගරු මන්ත්‍රී කේ.එල්.ඩී.ජී.සංජය අප්පුහාමි මයා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි. ඉන්පසු එම යෝජනාව විවාදයකින් තොරව ඒකමතිකව සම්මත විය.

**කාර්මික සේවා කාරක සභාව වෙත පැවරෙන බලතල**

1. සභාව විසින් ක්‍රියාත්මක කල යුතු පහත සදහන් කටයුතු වලට අදාල වාර්ෂික සැලසුම් හා සිව් අවුරුදු සැලසුම් ක්‍රියාත්මක කිරීම හා ඊට අදාල ඇස්තමේන්තු අනුමත කිරීම.
   I. මාර්ග සංවර්ධන කටයුතු
   II. ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධන කටයුතු
   III. පාලම් බෝක්කු හා කාණු පද්ධති සංවර්ධන කටයුතු
2. සභාව මඟින් ක්‍රියාත්මක කරන ඉදිකිරීම් හා නඩත්තු සේවාවට අදාල කටයුතු වල ප්‍රගතිය මාසිකව සමාලෝචනය කිරීම හා ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග තීරණය කිරීම.
3. සභාව විසින් පරිහරණය කරන ඉඩම් හා ගොඩනැගිලිවල නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීම හා ඒවා ඵලදායික ලෙස භාවිතා කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගරු සභාපතිතුමා වෙත හා සභාව වෙත වාර්තා කිරීම.
4. පැවරී ඇති බලතල වලට අදාලව ඉදිරිපත් වන විමර්ෂන වාර්තා, විගණන වාර්තා, ගිණුම්කාරක සභා වාර්තා සලකා බැලීම හා පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
5. පැවරී ඇති බලතල වලට අදාලව කාර්ය ස්ථාන පරික්ෂා කිරීම, කාර්ය මණ්ඩලයේ කටයුතු පරික්ෂා කිරීම හා ඒ තුළින් හඳුනා ගන්නා ලද අඩුපාඩු නිවැරදි කිරීමට අදාල උපදෙස් ගරු සභාපතිතුමා වෙත හා සභාව වෙත ඉදිරිපත් කිරීම.
6. සභාවේ සියලුම ඉදිකිරීම් වලට අදාල ඇස්තමේන්තු අනුමත කිරීම.
7. පැවරී ඇති කටයුතු වලට අදාල වන වාර්ෂික අයවැය යෝජනා, ව්‍යාපෘති වාර්තා හා අයවැය ඇස්තමේන්තු ගරු සභාපතිතුමා වෙත ඉදිරිපත් කිරීම.
8. පැවරී ඇති විෂයන්ට අදාල කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කරන අංශ ප්‍රධානීන් හා සේවක පිරිස් ඇගයීම හා දුර්වල අංශ ප්‍රධානීන් හා සේවක පිරිස් පිළිබඳව ගරු සභාපතිතුමා වෙත වාර්තා කිරීම.
9. පැවරී ඇති විෂයන්ට අදාල මහජන සේවාවන්ට අදාල කටයුතු කාර්යක්ෂමව කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගරු සභාපතිතුමා වෙත ඉදිරිපත් කිරීම.
10. පැවරී ඇති විෂයන්ට අදාල අණපණත්, අතුරු ව්‍යවස්ථා, පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ ක්‍රියාවට නැංවීම සහ ඒවායේ සංශෝධනය විය යුතු කරුණු ඇත්නම් සභාව වෙත වාර්තා කිරීම.
11. විෂයන්ට අදාල දේශිය/ විදේශිය දැනුම සහ පුහුණු කමිටු සාමාජිකයින් වෙත හා කාර්යය මණ්ඩලය වෙත ලබා දීම.
12. සභාවේ කටයුතු විධිමත් කිරීම සඳහා අවශ්‍ය නව අතුරු ව්‍යවස්ථා හා ප්‍රතිපත්ති සකස් කර සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.
13. පැවරී ඇති කටයුතු වල ප්‍රගතිය කාර්තු වශයෙන් හා වාර්ෂිකව සකස් කර මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රදර්ශනය කිරීම.
14. කමිටුව වෙත පැවරෙන බලතල වලට අදාල කටයුතුවල ප්‍රගතිය මාසිකව සමාලෝචනය කිරීම හා කමිටු වාර්තාව ඊලඟ මහ සභා රැස්වීම වෙත ඉදිරිපත් කිරීම.

**යෝජනා අංක (i) c. ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව වෙත අදාල බලතල පැවරීම සහ කාරක සභා පත් කිරීම**

ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව වෙත බලතල පැවරීම හා කාරක සභාවක් පත් කිරීමට අදාල පහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාවට ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සංදීප් මයා, ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මිය, ගරු මන්ත්‍රී කේ.එල්.ඩී.ජී.සංජය අප්පුහාමි මයා, ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මිය, ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය, ගරු මන්ත්‍රී කේ.ඩිලාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා, ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය, ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මයා, ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා, ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ආර්.ෂවීන් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය, ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය හා බල ප්‍රදේශයේ පදිංචිකරුවන් ලෙස ෂර්ලි පෙරේරා මයා, දූෂාන් නිරෝෂන් මයා හා චන්දිමා ජයසේකර මිය පත් කිරීමට හා පහත සඳහන් බලතල පැවරීමට සුදුසු බව යෝජනා කරන ලදි.

ඉන් අනතුරුව ගරු මන්ත්‍රී ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මයා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාවට පත් කර ඇති ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා වෙනුවට ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මියගේ නම යෙදිය යුතු බව යෝජනා කරන ලදි. එලෙසම බල ප්‍රදේශයේ පදිංචිකරුවන් ලෙස රියෙන්සි රෝහිත මයා වෙනුවට ෂර්ලි පෙරේරා මයා ලෙස සංශෝධනය විය යුතු අතර දූෂාන් මංජුල මයා නොව දූෂාන් නිරෝෂන් මයා ලෙස නිවැරදි විය යුතු බව යෝජනා විය.
පසුව ගරු මන්ත්‍රී ඇලෙක්ස් නිශාන්ත මයා විසින් බල ප්‍රදේශයේ පදිංචිකරුවන් තෝරා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව ගරු සභාපති තුමාගෙන් විමසන ලදි. එමෙන්ම බල ප්‍රදේශයේ පදිංචිකරුවන් තෝරා ගැනීමේදි විපක්ෂයටද අවස්ථාවක් ලැබුනොත් වඩා ඵලදායි වන බව පැවසීය.

තවද ගරු මන්ත්‍රී සුසන්ත ශ්‍රීනාත් මහතාද බල ප්‍රදේශයේ පදිංචිකරුවන් තෝරා ගැනීමේදි තම පක්ෂයේ අයෙකු සඳහාද අවස්ථාවක් ලබා දීම සුදුසු බව පැවසුවේය.

පසුව ගරු මන්ත්‍රී ඇලෙක්ස් නිශාන්ත මයා විසින් අසා සිටියේ බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ සංඛ්‍යාව වෙනසක් සිදු කල හැකිද යන්නයි. එහෙත් එම පැනයට පිළිතුරු වශයෙන් ගරු සභාපතිතුමා පැවසුවේ එම සංඛ්‍යාව තීරණය වූයේ චක්‍රලේඛයට අනුව බවයි.

ඒ අනුව ගරු සභාපතිතුමා මීළඟ සභා වාරයේදි මේ පිළිබඳව කතිකාවතක් කිරීමට බලාපොරොත්තු වන බව පවසන ලදි.

එම සංශෝධන වලට යටත්ව ගරු මන්ත්‍රී ජගත් කීර්ති කුමාර අබේරත්න මයා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි. ඉන්පසු එම යෝජනාව විවාදයකින් තොරව ඒකමතිකව සම්මත විය.

**ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව වෙත පැවරෙන බලතල**

1. සභාව විසින් සැපයිය යුතු පහත සඳහන් සේවාවන්ට අදාල වාර්ෂික සැලසුම් හා සිව් අවුරුදු සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
    I. පුස්තකාල සේවාව
    II. පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සේවාව

III. ආයුර්වේද සේවාව

IV. බල ප්‍රදේශයේ ක්‍රීඩා භූමි සඳහා

2. බල ප්‍රදේශයේ ළමා, තරුණ, ආබාධිත හා අඩු ආදායම්ලාභී පුරවැසියන් සඳහා අවශ්‍ය වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

3. බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ආගමික වැඩසටහන්, අධ්‍යාපන වැඩසටහන්, සාහිත්‍ය හා සංස්කෘතික වැඩසටහන්, ක්‍රීඩා වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

4. බල ප්‍රදේශයේ කතෘවරුන්, නර්තන ශිල්පීන්, ක්‍රීඩකයින් ආදි විශේෂ හැකියා ඇති පුද්ගලයින් හඳුනා ගැනීම හා එම අයගේ දියුණුව සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

5. බරපතල රෝගාබාධ වලින් පෙලෙන පුද්ගලයින්ට හා ආපදාවන්ට පත් වූ අයට සහන සැලසීම.

6. ප්‍රජා මණ්ඩල පිහිටුවීම, ප්‍රජාව දිරිමත් කිරිම සඳහා එම ප්‍රජා මණ්ඩල වලට උපකරණ සැපයීම.

7. පැවරී ඇති බලතල වලට අදාලව ඉදිරිපත් වන විමර්ශන වාර්තා, විගණන වාර්තා, ගිණුම්කාරක සභා වාර්තා සලකා බැලීම හා පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

8. පැවරී ඇති බලතල වලට අදාලව කාර්ය ස්ථාන පරික්ෂා කිරීම, කාර්ය මණ්ඩලයේ කටයුතු පරික්ෂා කිරීම හා ඒ තුලින් හඳුනා ගන්නා ලද අඩුපාඩු නිවැරදි කිරීමට අදාල උපදෙස් ගරු සභාපතිතුමා වෙත හා සභාව වෙත ඉදිරිපත් කිරීම.

9. පැවරී ඇති කටයුතු වලට අදාල ව්‍යාපෘති වාර්තා හා ඇස්තමේන්තු අනුමත කිරීම.

10. පැවරී ඇති කටයුතු වලට අදාල වන වාර්ෂික අයවැය යෝජනා, ව්‍යාපෘති වාර්තා හා අයවැය ඇස්තමේන්තු ගරු සභාපතිතුමා වෙත ඉදිරිපත් කිරීම.

11. පැවරී ඇති විෂයන්ට අදාල කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කරන අංශ ප්‍රධානීන් හා සේවක පිරිස් ඇගයීම හා දුර්වල අංශ ප්‍රධානීන් හා සේවක පිරිස් පිළිබඳව ගරු සභාපතිතුමා වෙත වාර්තා කිරීම.

12. පැවරී ඇති විෂයන්ට අදාල මහජන සේවාවන්ට අදාල කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගරු සභාපතිතුමා වෙත ඉදිරිපත් කිරීම.

13. පැවරී ඇති විෂයන්ට අදාලව අණපනත්, අතුරු ව්‍යවස්ථා, පළාත් පාලන ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම සහ ඒවායේ සංශෝධනය විය යුතු කරුණු ඇත්නම් මහ සභාව වෙත වාර්තා කිරීම.

14. විෂයන්ට අදාල දේශිය/ විදේශිය දැනුම සහ පුහුණු කමිටු සාමාජිකයින් වෙත හා කාර්යය මණ්ඩලය වෙත ලබා දීම.

15. සභාවේ කටයුතු විධිමත් කිරීම සඳහා අවශ්‍ය නව අතුරු ව්‍යවස්ථා හා ප්‍රතිපත්ති සකස් කර සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.
16. බල ප්‍රදේශයේ පෞද්ගලික අංශයේ දායකත්වය සහිතව ක්‍රියාත්මක කල හැකි වැඩසටහන් හා ව්‍යපෘති හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
17. පැවරී ඇති කටයුතු වල ප්‍රගතිය කාර්තු වශයෙන් හා වාර්ෂිකව සකස් කර මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රදර්ශනය කිරීම සඳහා කටයුතු කිරීම.
18. කමිටුව වෙත පැවරෙන බලතල වලට අදාල කටයුතු වල ප්‍රගතිය මාසිකව සමාලෝචනය කිරීම හා කමිටු වාර්තාව ඊලග මහ සභා රැස්වීම වෙත ඉදිරිපත් කිරීම.

**යෝජනා අංක (i) d. පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව වෙත බලතල පැවරීම සහ කාරක සභා පත් කිරීම**

පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව වෙත බලතල පැවරීම හා කාරක සභාවක් පත් කිරීමට අදාල පහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාවට ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා, ගරු මන්ත්‍රී ඩබ්.දිනේෂ් සංජීව ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා ,ගරු මන්ත්‍රී කේ.එල්.ඩී.ජී.සංජය අප්පුහාමි මයා, ගරු මන්ත්‍රී ආර්.එම්.අජිත් උදයසිරි රණතුංග මයා, ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මිය, ගරු මන්ත්‍රී ජගත් කීර්ති කුමාර අබේරත්න මයා, ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා, ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මයා, ගරු මන්ත්‍රී බී. ඇන්ටනී සුනිල් සාන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා, ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රීට් මිය, ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මයා, ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඩබ්, විමලසිරි පෙරේරා මයා හා බල ප්‍රදේශයේ පදිංචිකරුවන් ලෙස සුමිත් ඇන්ඩසන් මයා, ජයරුවන් ප්‍රනාන්දු මයා, විජයනන්ද සූරවීර මයා පත් කිරීමට හා පහත සඳහන් බලතල පැවරීමට සුදුසු බව යෝජනා කරන ලදි.

ඉන් අනතුරුව ගරු මන්ත්‍රී එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාවට පත් කර ඇති ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මයා වෙනුවට ආර්.එම්.අජිත් උදයසිරි රණතුංග මයාගේ නම යෙදිය යුතු බව යෝජනා කරන ලදි. එලෙසම මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාවේ සාමාජික ගරු මන්ත්‍රී බී. ඇන්ටනී සුනිල් සාන්ත පෙරේරා මයා පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාවේ සාමාජික ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය සමඟ සුහද මාරුවක් සිදු කරන බවද යෝජනා විය.

එම සංශෝධන වලට යටත්ව ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි. ඉන්පසු එම යෝජනාව විවාදයකින් තොරව ඒකමතිකව සම්මත විය.

## පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව වෙත පැවරෙන බලතල

1. පහත සඳහන් කරුණු වලට අදාල වාර්ෂික සැලසුම් හා සිව් අවුරුදු සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
   I. පරිසර සංරක්ෂණය හා ප්‍රවර්ධනය
   II. මහජන සෞඛ්‍ය සංරක්ෂණය හා ප්‍රවර්ධනය
   III. පවිත්‍රතා සේවා හා කසළ/ මල අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කිරීම
   IV. සුසාන භුමි හා ආදාහනාගාර පහසුකම් සංවර්ධනය කිරීම
   V. බල ප්‍රදේශයේ තුල සිදු වන ඉඩම් කොටස් කිරීම සහ ගොඩනැගිලි ඉදිකිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම.
2. බල ප්‍රදේශයේ පරිසර හිතකාමී ආහාර නිෂ්පාදනය සංවර්ධනයට අවශ්‍ය වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මත කිරීම.
3. බල ප්‍රදේශයේ ඉඩම් පරිහරණය විධිමත් කිරීම සඳහා වන කලාප සැලසුම් සකස් කිරීමට අදාල යෝජනා සභාව වෙත වාර්තා කිරීම.
4. පැවරී ඇති බලතල වලට අදාලව ඉදිරිපත් කරන විමර්ශන වාර්තා, විගණන වාර්තා, ගිණුම්කාරක සභා වාර්තා සලකා බැලීම හා පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
5. පැවරී ඇති බලතල වලට අදාලට කාර්ය ස්ථාන පරික්ෂා කිරීම, කාර්ය මණ්ඩලයේ කටයුතු පරික්ෂා කිරීම හා ඒ තුලින් හඳුනා ගන්නා ලද අඩුපාඩු නිවැරදි කිරීමට අදාල උපදෙස් ගරු සභාපතිතුමා වෙත හා සභාව වෙත ඉදිරිපත් කිරීම.
6. පැවරී ඇති කටයුතු වලට අදාල ව්‍යාපෘති වාර්තා හා ඇස්තමේන්තු අනුමත කිරීම.
7. පැවරී ඇති කටයුතු වලට අදාල වන වාර්ෂික අයවැය යෝජනා, ව්‍යාපෘති වාර්තා හා අයවැය ඇස්තමේන්තු ගරු සභාපතිතුමා වෙත ඉදිරිපත් කිරීම.
8. පැවරී ඇති විෂයන්ට අදාල කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කරන අංශ ප්‍රධානීන් හා සේවක පිරිස් ඇගයීම හා දුර්වල අංශ ප්‍රධානීන් හා සේවක පිරිස් පිළිබඳව ගරු සභාපතිතුමා වෙත වාර්තා කිරීම.
9. පැවරී ඇති විෂයන්ට අදාල මහජන සේවාවන්ට අදාල කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගරු සභාපතිතුමා වෙත ඉදිරිපත් කිරීම.
10. පැවරී ඇති විෂයන්ට අදාලව අණපනත්, අතුරු ව්‍යවස්ථා, පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ ක්‍රියාවට නැංවීම සහ ඒවායේ සංශෝධනය විය යුතු කරුණු ඇති නම් මහ සභාව වෙත ඉදිරිපත් කිරීම.
11. විෂයන්ට අදාල දේශිය/ විදේශිය දැනුම හා පුහුණු කමිටු සාමාජිකයින් වෙත හා කාර්ය මණ්ඩලය වෙත ලබා දීම.

12. සභාවේ කටයුතු විධිමත් කිරීම සඳහා අවශ්‍ය නව අතුරු ව්‍යවස්ථා සකස් කර සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.
13. බල ප්‍රදේශයේ පෞද්ගලික අංශයේ දායකත්වය සහිතව ක්‍රියාත්මක කල හැකි වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
14. පැවරී ඇති කටයුතු වල ප්‍රගතිය කාර්තු වශයෙන් හා වාර්ෂිකව සකස් කර මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රදර්ශනය කිරීම.
15. කමිටු වලට පැවරෙන බලතල වලට අදාල කටයුතු වල ප්‍රගතිය මාසික සමාලෝචනය කිරීම හා කමිටු වාර්තාව ඊලග මහ සභා රැස්වීම වෙත ඉදිරිපත් කිරීම.

**යෝජනා අංක (i) e. පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව වෙත බලතල පැවරීම සහ කාරක සභාව පත් කිරීම.**

පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව වෙත බලතල පැවරීම හා කාරක සභාවක් පත් කිරීමට අදාල පහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාවට ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මයා, ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා, ගරු මන්ත්‍රිනී එල්.ජයංගා රුවනාරි ප්‍රනාන්දු මිය, ගරු මන්ත්‍රී ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මයා, ගරු මන්ත්‍රී සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය, ගරු මන්ත්‍රී කේ.ඩිලාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා, ගරු මන්ත්‍රී ජගත් කීර්ති කුමාර අබේරත්න මයා, ගරු මන්ත්‍රිනී ආර්.පී.මෙලනි චතුරිකා රන්තිලක මිය, ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මයා, ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා, ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මයා, ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා, ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය යෝජනා වූ අතර බල ප්‍රදේශයේ පදිංචිකරුවන් ලෙස අචිනි තරංගා මිය, සුදත් චන්දන මයා, ෂර්ලි පෙරේරා මයා පත් කිරීමට හා පහත සඳහන් බලතල පැවරීමට සුදුසු බව යෝජනා කරන ලදි.

ඉන් අනතුරුව ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාවට පත් කර ඇති ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා වෙනුවට ගරු මන්ත්‍රී කේ.ඩිලාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයාගේ නම යෙදිය යුතු බව යෝජනා කරන ලදි.

එම සංශෝධන වලට යටත්ව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි. ඉන්පසු එම යෝජනාව විවාදයකින් තොරව ඒකමතිකව සම්මත විය.

**පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව වෙත පැවරෙන බලතල**

1. පහත සඳහන් කරුණු වලට අදාල වාර්ෂික සැලසුම් හා සිව් අවුරුදු සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම.
   I. වෙළඳපොල පහසුකම් හා නාගරික පහසුකම් සංවර්ධනය
   II. පානීය ජල සම්පාදනය හා ජල මූලාශ්‍ර සංරක්ෂණය
   III. ආපදා වැලැක්වීම හා ගිනි අනතුරු පාලනය කිරීම.
   IV. වීථි ආලෝකකරණ කටයුතු
2. බල ප්‍රදේශයේ ව්‍යාපාරික ප්‍රජාව විධිමත් කිරීම හා දිරිමත් කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
3. සභාව සතු වාහන, යන්ත්‍රෝපකරණ සේවයට යොදා ගැනීම පිළිබඳව සොයා බැලීම හා ඒ පිළිබඳව නිර්දේශ සභාපති වෙත හා සභාව වෙත වාර්තා කිරීම.
4. පැවරී ඇති බලතල වලට අදාලව ඉදිරිපත් වන විමර්ශන වාර්තා, විගණන වාර්තා, ගිණුම්කාරක සභා වාර්තා සලකා බැලීම හා පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
5. පැවරී ඇති බලතල වලට අදාලව කාර්ය ස්ථාන පරික්ෂා කිරීම, කාර්ය මණ්ඩලයේ කටයුතු පරික්ෂා කිරීම හා ඒ තුලින් හඳුනා ගන්නා ලද අඩුපාඩු නිවැරදි කිරීමට අදාල උපදෙස් ගරු සභාපතිතුමා වෙත හා සභාව වෙත ඉදිරිපත් කිරීම.
6. පැවරී ඇති බලතල වලට අදාල ව්‍යාපෘති වාර්තා හා ඇස්තමේන්තු අනුමත කිරීම.
7. පැවරී ඇති බලතල වලට අදාල වන වාර්ෂික අයවැය යෝජනා, ව්‍යාපෘති වාර්තා හා අයවැය ඇස්තමේන්තු ගරු සභාපතිතුමා වෙත ඉදිරිපත් කිරීම.
8. පැවරී ඇති විෂයන්ට අදාල කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කරන අංශ ප්‍රධානීන් හා සේවක පිරිස් ඇගයීම හා දුර්වල අංශ ප්‍රධානීන් හා සේවක පිරිස් පිළිබඳ ගරු සභාපතිතුමා වෙත ඉදිරිපත් කිරීම.
9. පැවරී ඇති විෂයන්ට අදාල මහජන සේවාවන්ට අදාල කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගරු සභාපත්තුමා වෙත ඉදිරිපත් කිරීම.
10. පැවරී ඇති විෂයන්ට අදාලව පණත් ආඥා පණත්, අතුරු ව්‍යවස්ථා, පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ ක්‍රියාවට නැංවීම සහ ඒවායේ සංශෝධනය විය යුතු කරුණු ඇත්නම් මහ සභාව වෙත වාර්තා කිරීම, ප්‍රගතිය කාර්තු වශයෙන් හා වාර්ෂිකව සකස් කර මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රදර්ශනය කිරීම සඳහා කටයුතු කිරීම.
11. විෂයන්ට අදාල දේශිය/ විදේශිය දැනුම සහ පුහුණු කමිටු සාමාජිකයින් වෙත හා කාර්යය මණ්ඩලය වෙත ලබා දීම.
12. සභාවේ කටයුතු විධිමත් කිරීම සඳහා අවශ්‍ය නව අතුරු ව්‍යවස්ථා හා ප්‍රතිපත්ති සකස් කර සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.
13. කමිටුව වෙත පැවරෙන බලතල වලට අදාල කටයුතු වල ප්‍රගතිය මාසික සමාලෝචනය කිරීම හා කමිටු වාර්තාව ඊලඟ මහ සභා රැස්වීම වෙත ඉදිරිපත් කිරීම.

**යෝජනා අංක (ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීම සඳහා අනුමැතිය ලබා දීම.**

සභාවට අවශ්‍ය භාණ්ඩ/සේවා සපයා ගැනිමට හා කර්මාන්ත වැඩ විෂයන් ඉටුකර ගැනිම සඳහා රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය හා මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කිරීම සඳහා සභාවේ ගණන් දීමේ නිලධාරියා වෙත හා ටෙන්ඩර් මණ්ඩලය වෙත අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු සභාපති තුමා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි. ඉන්පසු එම යෝජනාව විවාදයකින් තොරව ඒකමතිකව සම්මත විය.

**යෝජනා අංක (iii) ටෙන්ඩර් මණ්ඩලය පත් කිරීම (1988 මූල්‍ය හා පරිපාලන රිති අංක 178)**

ටෙන්ඩර් මණ්ඩලය පත් කිරීම හා ඊට අදාල බලතල පැවරීමට අදාල යෝජනාව ගරු සභාපති තුමා විසින් ඉදිරිපත් කරන ලදි.

ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති ලෙස ගරු සභාපති ටී.බී.ඩී ඇන්ටනී කුමාර් මයා, සාමාජික ලෙස ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා සහ ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණී රෙක්ස් ප්‍රනාන්දු මයා යෝජනා කරන ලදි.

ටෙන්ඩර් මණ්ඩල සාමාජික සංඛ්‍යාව 05 දක්වා වැඩි කර තම පක්ෂ වලින් ඒ සඳහා සාමාජිකයෙකු බැගින් පත් කර ගන්නා ලෙස ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා සහ ගරු මන්ත්‍රී ඩබ්.ඇලේක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා යෝජනා කරන ලදි. සාමාජික සංඛ්‍යාව වැඩි කිරීම පිළිබඳව මීළඟ සභා වාරයේදී සාකච්ඡා කරන බව සභාපතිතුමා විසින් දන්වන ලදි.

එම සංශෝධන වලට යටත්ව ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි. ඉන්පසු එම යෝජනාව විවාදයකින් තොරව ඒකමතිකව සම්මත විය.

**ටෙන්ඩර් මණ්ඩලය වෙත පවරන බලතල**

1. සභාව වෙත ලැබෙන ටෙන්ඩර් පත්‍ර / ලංසු අයදුම් පත්‍ර විවෘත කිරීම.
2. ලංසු ඇගයීම සඳහා ඇගයීම කමිටු පත් කිරීම.
3. ලංසු ඇගයීම් කමිටු නිර්දේශ අනුමත කිරීම හා මිළ ගණන් පත් / ටෙන්ඩර් පත් අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම.

**යෝජනා අංක (iv) සභාව වෙත පැවරී ඇති කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා කාර්ය මණ්ඩලයට බලතල පැවරීමට අදාල යොජනාව. (ප්‍රාදේශිය සභා පණතේ 216 වගන්තිය හා 133 වගන්තිය)**

ගරු සභාපති තුමා විසින් මෙම යෝජනාව ඉදිරිපත් කල අතර ගරු මන්ත්‍රි කේ.ඩිලාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව විවාදයකින් තොරව ඒකමතිකව සම්මත විය.

**කාර්ය මණ්ඩලයට පැවරෙන බලතල**

| අනු අංකය | ප්‍රා.ස පනතේ යොමුව | පවරා දෙනු ලබන බලය | බලය පැවරෙන අය |
|---|---|---|---|
| 01 | 216 | (අ) ප්‍රාදේශිය සභාවට එරෙහිව පවරනු ලබන නඩු කටයුතු වලදි සභාවේ අයිතිවාසිකම් වෙනුවෙන් විත්තිවාචක ඉදිරිපත් කිරීම, සහ ඒ කාර්යයේදි සභාව වෙනුවෙන් පෙනී සිටින නීතීඥවරයාට හෝ නීතීඥවරුන්ට සභාව වෙනුවෙන් පෙනී සිටීමට බලය පැවරීම/පත්කිරීමේ (Proxy / Appointment-පෙරකලාසිය/පත් කිරීම) අත්සන් කිරීම,<br><br>(ආ) වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවට, ප්‍රාදේශිය සභා පනතෙන් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් පැවරී ඇති කිසියම් බලතලයක් ක්‍රියාවට නැංවීමේදි හෝ ක්‍රියාවට නැංවීම අවශ්‍ය යයි අදහස් කරනු ලබන විටකදි හෝ සභාවේ අයිතිවාසිකම් ආරක්ෂා කල යුතු කිසියම් අවස්ථාවකදි යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට එරෙහිව කිසියම් අධිකරණයක නඩු පැවරීම සහ ඒ කාර්යයේදි සභාව වෙනුවෙන් පෙනී සිටින නීතීඥවරයාට හෝ නීතීඥවරුන්ට සභාව වෙනුවෙන් පෙනී සිටීමට බලය පැවරීම/ පත් කිරීමේ (Proxy/Appointment-පෙරකලාසිය/පත් කිරීම) අත්සන් කිරීම,<br><br>(ඇ) ඉතා හදිසි අවශ්‍යතාවලදී සභාපතිතුමාගේ උපදෙස් මත සභාව වෙනුවෙන් අවශ්‍ය බලතල ක්‍රියාත්මක කිරිම | ප්‍රාදේශීය සභා ලේකම් ඩබ්.ඩී.ලූෂන් මයා<br><br>ප්‍රාදේශීය සභා ලේකම් ඩබ්.ඩී.ලූෂන් මයා<br><br>ප්‍රාදේශීය සභා ලේකම් ඩබ්.ඩී.ලූෂන් මයා |

| | | | |
|---|---|---|---|
| 02. | 133 | (අ) සභාව වෙනුවෙන් නිකුත් කරන චෙක්පත්වල පළමු අත්සන් යෙදීම.<br><br>(ආ) සභාව වෙනුවෙන් නිකුත් කරන චෙක්පත්වල දෙවන අත්සන් යෙදීම. | ප්‍රාදේශිය සභා ලේකම් ඩබ්.ඩී.ලූෂන් මයා<br><br>1.ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි එම්.පී.සමන්ත කුමාර මයා<br><br>2.කළමනාකරණ සේවා නිලධාරි එස්.ඒ.එම්.පී.අබේසිංහ මිය |

**යෝජනා අංක (v) ඉදිරි මහ සභා රැස්වීම් පැවැත්විය යුතු දිනයන් හා වේලාවන් තීරණය කිරීමට අදාල යොජනාව (ප්‍රාදේශිය සභා රීති අංක 02)**

ගරු සභාපති තුමා විසින් ඉදිරි මහ සභා රැස්වීම් පැවැත්විය යුතු දිනයන් හා වේලාවන් පිළිබද යෝජනාව ඉදිරිපත් කරන ලදි.

ඒ අනුව 2025.06.27 දින මීළඟ මහ සභාව පැවැත්වීමට යෝජනා කල අතර, 2025 ජූලි මස සිට සෑම මසකම දෙවන සතියේ අඟහරුවාදා දින මහ සභා රැස්වීම පැවැත්වීමට යෝජනා කරන ලදි.

මෙම යෝජනාව ගරු මන්ත්‍රී සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු එම යෝජනාව විවාදයකින් තොරව ඒකමතිකව සම්මත විය.

පසුව සියලුම මන්ත්‍රීවරුන්ට තම තමාව කෙටියෙන් හඳුන්වා දීමක් කරන ලෙස ගරු සභාපති තුමා විසින් දැනුම් දෙන ලදි.

ඒ අනුව ගරු උප සභාපතිතුමාගෙන් ආරම්භ කර මන්ත්‍රීවරු 43 දෙනාම තම තමන්ගේ තොරතුරු ප්‍රකාශ කලෝය. සියලු දෙනාව හඳුන්වා දීමෙන් පසුව ගරු සභාපති ටී.බී.ඩී ඇන්ටනී කුමාර් මයා පවසා සිටියේ අප සියළු දෙනාම වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව ලෙස සතුටු විය යුතු බවයි. එයට හේතුව නම් වෘත්තීය අතින් සෑම ක්ෂේත්‍රයක්ම නියෝජනය කරන සමබර මන්ත්‍රී මණ්ඩලයක් අප සතු වන බවයි.

ඉන් පසුව ගරු සභාපති තුමා විසින් මහ සභාව කාරක සභාවක් බවට පත් කර වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ ලේකම් ඩබ්.ඩී. ලූෂන් මයා හට සභාව ආමන්ත්‍රණය කිරීමයට අවස්ථාවක් ලබා දෙන ලෙස යෝජනාව ඉදිරිපත් කල අතර ගරු මන්ත්‍රී ඩබ්.ඇලේක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ලේකම් ඩබ්.ඩී. ලූෂන් මයා කතා කරමින්, වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව 1988 ජනවාරි මාසයේ ආරම්භ වී ඇති බවත් මෙම ප්‍රාදේශිය සභාව ලංකාවේ ඇති හොඳම ප්‍රාදේශිය සභාවක් බවත් අවධාරණය කරන ලදි. ඒ අනුව මෙම ප්‍රාදේශිය සභාවේ සභාපතිවරයෙකු වීමට ලැබීම ගරු සභාපති ටී.බී.ඩී ඇන්ටනී කුමාර් මයාටත් මන්ත්‍රී මණ්ඩලයටත් ඉතා අභිමානයක් වන බව එතුමා පැවසීය. එමෙන්ම මන්ත්‍රී මණ්ඩලය තුල ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු 09 දෙනෙක් සිටින බැවින් ඔවුන්ගේ අත්දැකීම් හා දැනුම ලබා ගනිමින් ඉදිරියට ගමන් කල හැකි බව පැවසීය. ඉදිරියේදි හඳුනාගත් අභියෝග ගණනාවක් ජයග්‍රහණය කිරීමට ඇති බව එතුමා පවසන ලදි. කසළ කලමනාකරණය තුල වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව තවත් ඉදිරියට යා යුතු බවත් මාර්ග පද්ධතිය 700km පමණ විහිදි තිබුණත් එහි තාර, ප්‍රිමික්ස් හා කොන්ක්‍රීට් දමා සංවර්ධනය කර ඇත්තේ 500km පමණ දුරට බවත් තවත් 200km ට වැඩි ප්‍රමාණයක් සංවර්ධනය කිරීමට ඇති අතර වර්ෂා ජලය බැස යාමේ ගැටලුවද වෙන්නප්පුව බල ප්‍රදේශය තුල පවතින බව ප්‍රකාශ කරන ලදි. එලෙස හඳුනාගත් ගැටලු ඉදිරි කමිටු රැස්වීම් වල සාකච්ඡා කර ඒ සඳහා අවශ්‍ය යෝජනා මහ සභාව වෙත යොමු

කිරීමට බලාපොරොත්තු වන බව පැවසීය. අවසාන වශයෙන් අභිනවයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට තේරි පත් වූ ගරු සභාපති තුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට ඉදිරි වැඩ කටයුතු සාර්ථකව කරගෙන යාමට අවශ්‍ය ශක්තිය, ධෛර්ය හා වාසනාව ලැබේවායි පතමින් කතාව අවසන් කරන ලදි.

ඉන් පසුව ගරු මන්ත්‍රී  ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා විසින් කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීමට යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා විසින් ස්ථිර කරන ලදි.

පසුව ගරු සභාපතිතුමා විසින් පක්ෂ විපක්ෂ නියෝජනය කරමින් මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුට සභාව ආමන්ත්‍රණය කිරීමට විනාඩි 05ක් පමණ කාලයක් ලබා දුන්නේය. එහිදී ප්‍රථමයෙන් මහ සභාව ආමන්ත්‍රණය කිරීමට ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයාට අවස්ථාව හිමි විය.

ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා කතා කරමින්, ප්‍රථමයෙන් මෙම විශේෂ මහ සභාව ආමන්ත්‍රණය කිරීමට ලැබීම පිලිබඳව ස්තූතිය ප්‍රකාශ කලේය. එමෙන්ම එතුමා ඇතුළුව සියලුම නවක මන්ත්‍රීන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට ආධුනික වුවත් ඔවුන් දේශපාලනයට ආධුනික නැති බවත්, ඔවුන් ගම් මට්ටමින් හා කොට්ඨාස මට්ටමින් ජනතාව සමඟ විශාල වැඩ ප්‍රමාණයක් සිදු කරමින් මෙතැනට ආ බවත් අවධාරණය කරන ලදි. ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති මාලාව අනුව නාස්තිය, දූෂණය හා වංචාව පිටු දැකීම ඔවුන්ගේ අරමුණ බවත් එය වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව තුලද ව්‍යාප්ත කල යුතු බවත් අවධාරණය කලේය. එමෙන්ම වර්තමානයේ විශාල වශයෙන් පැන නැගී ඇති ගැටලුවක් වන කසල කලමනාකරණය පිලිබද නිවැරදි අවබෝධයක් පෙර පාසල් අවධියේ සිටම දරුවන්ට ලබා දිය යුතු බවත් එමගින් අනාගත පරම්පරාව නිවැරදි මගකට ගත හැකි බවත් පැවසීය. එමෙන්ම ඉදි කිරීම් ක්ෂේත්‍රයේද යම් යම් ගැටලුකාරි තත්වයන් පවතින බැවින් ඒවාද නිසි ක්‍රියාවලියකට අනුව සිදු කරගෙන යමින් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව හොඳම සභාවක් කිරීමට පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු සියලු දෙනාගේම සහය පතමින් කතාව නිම කලේය.

ගරු මන්ත්‍රී  ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා කතා කරමින්, වෙන්නප්පුව ආසනයේ ජනතාව  ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ වෙත ඡන්ද 10,991ක් ලබා දී මන්ත්‍රීවරු අට දෙනෙකු පත් කිරීම පිළිබඳව මහජනතාවට ස්තූති කල අතර වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව වයඹ පළාතෙම වයඹ අභිමානය බවට පත් කල බවත් එය ඉදිරියටත් එලෙසම පවත්වාගෙන යාමට හැකි වන ලෙස සුභාසිංෂනය කරන ලදි. ඔවුන් විසින් ආරම්භ කර ඇති කසල අංගනය වැඩි දියුණු කර ආදායම් මාර්ගයක් කර ගැනීමට නව පක්ෂයට හැකියාවක් ඇති බව පැවසුවේය. එලෙසම රේඛීය අමාත්‍යාංශය යටතේ ප්‍රතිපාදන ලබා ගෙන වෙන්නප්පුව දියුණු කිරීමට කටයුතු කල බවත් විශාල ස්ථිර තැන්පතු මුදල් ප්‍රමාණයක් සමඟ නව ආණ්ඩුවට මෙම ප්‍රාදේශීය සභාව භාර දෙන බවත් පැවසීය. අවසාන වශයෙන් ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ පක්ෂ නායකයින් සිහි පත් කල අතර වෙන්නප්පුව පුංචි පාර්ලිමේන්තුව දියුණුවෙන් දියුණුවටම පත් වේවායි ප්‍රාර්ථනා කරමින් කතාව අවසන් කලේය.

ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය කතා කරමින්, ලංකාවේ පළාත් පාලන ආයතන අතරින් ප්‍රාදේශීය සභාවේ කොට්ඨාස 25 ම ජයග්‍රහණය කර පොහොසත් රටක් ලස්සන ජීවිතයක් නිර්මාණය කර ගැනීම සඳහා අවශ්‍ය යෝධ පියවර ඔවුන් තබා ඇති බව පවසන ලදි. එමෙන්ම ඒ සඳහා දායකත්වය ලබා දුන් සියලු දෙනාට ස්තුතිය පුද කල අතර මන්ත්‍රිවරු 44 දෙනා අතරින් කාන්තා නියෝජනය 10 ක් සිටින අතර ඉන් ජාතික ජන බලවේගය නියෝජනය කරන මන්ත්‍රීවරියන් 5 දෙනෙකු තේරි පත් වී ඇති බව පැවසුවාය. කාන්තාවන් සවිබල ගන්වා ආදරය පිරුණු බල ප්‍රදේශයක් කිරීමට පැමිණි ඔවුන්ට සිටින්නේ ස්වෙච්ඡාවෙන් වැඩ කරන පිරිසක් බැවින් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව ලංකාවේ අංක 01 ප්‍රාදේශීය සභාව ප්‍රාදේශීය සභාවක් බවට පත් කිරීමට එක්ව කටයුතු කිරීමට ආරාධනා කරමින් කතාව අවසන් කලාය.

ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා කතා කරමින්, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් ඔහු තේරි පත් වූ අතර එම මන්ත්‍රී ධුරය භාවිතා කරමින්  80%ක් බලාපොරොත්තු වන්නේ හොඳ පුරවැසියෙක් බිහි කරන්නේ කෙසේද යන්න බව ප්‍රකාශ කරන ලදි. එමෙන්ම තම බලාපොරොත්තු වන්නේ එම කොට්ඨාසයේ සිටින මන්ත්‍රිවරුන් සමඟ එකතු වී රටේ පවතින අපරාධ රැල්ල 10%න් හෝ අඩු කරන ආකාරය පිලිබඳව බව ප්‍රකාශ කරන ලදි. එමෙන්ම සියලු දෙනාම එකතු වී හොඳ පරම්පරාවක් ඇති කල යුතු බව පවසන ලදි. දේශපාලන කෝණයකින් නොබලා සියලුම මන්ත්‍රිවරුනට සහය දක්වන බව පවසමින් කතාව නිම කරන ලදි.

ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා කතා කරමින්, පළාත් පාලන මැතිවරණයෙන් වෙන්නප්පුව ආසනයේ ජනතාවට අවශ්‍ය වූ පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ගොඩනැගීමේ අභිමතාර්ථය ඉටු කිරීම සඳහා ඔවුන් වෙත වගකීමක් ඇති බවත් වෙන්නප්පුව ආසනයේ විශාල ජනපද ප්‍රමාණයක් පිහිටා ඇති අතර ඒවායේ තරුණ කොටස් මත්ද්‍රව්‍ය වලින් විශාල ලෙස විනාශ වී ඇති බව සියලු දෙනාම දන්නා කරුණක් බව පැවසීය. ඒවායෙන් තරුණ ප්‍රජාව ගලවා ගැනීමේ අභියෝගය එතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය භාර ගන්නා අතර යහපත් සභාවක් ගොඩ නගා ගැනීමේ හා යහපත් හෙට දවසක් උදා කර දීමේ අභිලාශයෙන් වංචාවෙන් දූෂනයෙන් තොරව හෙට උපදින දරුවන් වෙනුවෙන් යහපත් හෙට දිනයක් සකස් කර දීමට ඔවුන් සැම ඇප කැප වී වැඩ කරනවා යැයි කියමින් කතාව අවසන් කරන ලදි.

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා කතා කරමින්, වර්ෂ 2011 දී පළමුවරට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය භාරගත් බවත් මීට පෙර මෙම සභාවේ සිටි ගරු සභාපතිවරුන් සිහි කරමින් තම කතාව ආරම්භ කලේය. එතුමා විසින් මෙම සභාව පළාතෙම ඉහල තත්වයක ඇති සභාවක් බව ප්‍රකාශ කරන ලදි. තවද එතුමාගේ කාලයේදී වෙන්නප්පුව හා දංකොටුව ලෙස වෙන් වී තිබුනු බවත් ඔවුන් සියලු දෙනා එකතු වී වෙන්නප්පුව ලෙස තනි සභාවක් බවට පත් කර ගත් බව හා 2018 සිට 2023 දක්වා කාලය තුල විශාල මුදලක් ඉතිරි කර තබා තමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලය නික්ම ගිය බවත් එසේ ගොඩ නගා ගත් සභාව නව පක්ෂයට තව දුරටත් ඉදිරියට ගෙන යාමට වාසනාය ශක්තිය ලැබේවායි පතමින් කතාව අවසන කරන ලදි.

ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා කතා කරමින්, ප්‍රාදේශීය සභාවේ ආරම්භය පිළිබද සිහිපත් කරමින් මේ වන විට තිබෙන තත්වයට ගෙන ඒම සඳහා උර දුන් නායකයන් සිහිපත් කල අතර එම නායකයින්ගේ හැකියාවන් මත වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව දියුණු කිරීම සඳහා ලැබූ දායකත්වය සිහිපත් කලේය. පෙර සභාවන් වලදී ඔවුන් පක්ෂ විපක්ෂ ලෙස බෙදීමක් නොමැතිව කටයුතු කල බවත් තමා ඇතුළු කණ්ඩායම විදේශ පුහුණු සඳහා පිටත් වූ බවද ප්‍රකාශ කලේය. මෙවර මහ සභාව තුල ආසන පනවා ඇති ආකාරය පිළිබඳව අලුත් වෙනසක් පෙනුනු බවත් එය ආණ්ඩු පක්ෂයේ අදහසක් බව එතුමා සිතන බවත් ප්‍රකාශ කලේය. එලෙසම විපක්ෂයක් ලෙස ඔවුන්ටද මෙහි යම් සේවයක් කිරීමට අවස්ථාව ඉල්ලා සිටි අතර ඒ සඳහා ක්‍රියාත්මක වීමටත් අවස්ථාව ඉල්ලා සිටින ලදි. අවසන් වශයෙන් සභාවේ කටයුතු කරගෙන යාමට විපක්ෂයේ සියලු දෙනාගේම සහයෝගය ලබා දෙන බව පවසමින් කතාව අවසන් කරන ලදි.

ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සංදීප් මයා කතා කරමින්, දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම සඳහා ප්‍රධානම වගකීම ඔවුන් ක්‍රියාවෙන් ඔප්පු කිරීමට කටයුතු කරන බවත් මේ සඳහා ඔවුන් වැඩ කරමින් ඉගෙන ගන්නා බවත් ඉගෙන ගනිමින් වැඩ කරන බවත් පැවසීය. තරුණ දේශපාලන නියෝජිතයින් ලෙස ඔවුන් මෙම සභාව තුල සිටින ජොෂ්ඨ මන්ත්‍රීවරුන්ගේ ආදර්ශයන්, අවවාදයන් හා මග පෙන්වීම් බලාපොරොත්තු වන බවත් මෙම වසර 04 වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව ලංකාවේ අංක එකේ සභාවක් බවට පත් කර ගැනීමට කටයුතු කරන බවත් පවසමින් කතාව නිම කරන ලදි.

ඉන් පසු මීළඟ මුදල් කමිටුව 2025.06.17 දින ප.ව 2.30 ට සහ කාර්මික කමිටුව 2025.06.18 දින ප.ව 2.30 ට පවත්වන බවත් සභා කටයුතු සිදු කිරීමේදී සියලු දෙනා සභා රීති හා අණ පණත් වලට අනුගත වී කටයුතු කල යුතු බවත් මෙම වසර 04 ඉතා වේගවත් ලෙස නිෂ්පාදන ආර්ථිකයට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ දායකත්වය ලබා දීම සහ ප්‍රදේශයේ ජනතාව වෙත කාර්යක්ෂම සුහද සේවයක් කිරීම අප සැමගේ යුතුකම බවත් ගරු සභාපතිතුමා පැවසීය.

ඉන් පසුව සියලු දෙනාටම ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු ප.ව 12.30ට පමණ අවසන් කරන ලදි.

ටී.බී.ඩී ඇන්ටනි කුමාර්
සභාපති,
වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව.